**ශීර්ෂය 414 - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 18 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 23 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගය කරන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්තවය පිළිබඳ ප්‍රකාශය

#### 1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

දේපල පිරියත උපකරණ ගිණුම්ගත කිරීමේදි පහත සඳහන්අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉදිකෙරෙමින් පවතින සීදුව පුහුණු මධ්‍යස්ථානයට අදාළ ගොඩනැගිල්ල සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු. 121,002,659 ක් වැය කිරිම, මූල්‍ය නොවන වත්කම් වල කෙරීගෙන යන වැඩ යටතේ සඳහන් නොකොට නිවාස නොවන ගොඩනැගිලි යටතේ, මිලදී ගැනීම් ලෙස දක්වා තිබුණි | වැරදීමකින් මූල්‍ය නොවන වත්කම් වල කෙරීගෙන යන වැඩ යටතේ සඳහන් කල යුතු මුදල නිවාස නොවන ගොඩනැගිලි මිලදී ගැනීම් යටතේ සටහන් කර ඇත. එම වරද නිවැරදි කිරීම සඳහා කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | වත්කම් වර්ගීකරණය නිවැරදිව සිදු කිරිමටත් නිවැරදිව වාර්තා කිරිමත් කළයුතු විම. |
| (ආ) | වත්කම් වර්ග 4 කට අයත් අයිතම් 77 ක වටිනකම රු. 3,815,643 ක් නිවැරදි වත්කම් වර්ගිකරණය යටතේ ගිණුම්ගත නොකොට පරිගණක උපාංග ලෙස ගිණුම්ගත කර තිබුණි. | අතපසුවීමකින් සිදුව ඇත. නිවැරදි වත්කම් වර්ගීකරණය යටතේ ගිණුම් ගත කිරීමට අදාල නිලධාරින් දැනුවත් කර ඇත. | නිවැරදිව වාර්තා කිරිමට කටයුතු කළයුතු විම. |
| (ඇ) | අමාත්‍යාංශයට අයත් පිළිමතලාවේ සහ බොරැල්ල පිහිටි පර්යේෂණ හා පුහුණු ආයතනයේ ඉඩම් ගොඩනැගිලි වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු අවම කර ගැනීමට කටයුතු කරමි. | ඉඩම් ගොඩනැගිලි වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළයුතු විම. |
| (ඈ) | වර්ෂය ආරම්භය රු. 589,293,499 ක්වූ කාර්යාල ගොඩනැගිලි ශේෂය තුළ රු. 540,000 ක්වූ සමාජ ආරක්ෂණ මණ්ඩල ගොඩනැගිලි ඉදිකිරීම් ඇතුළත්ව තිබුණි. | මෙම මුදල 2019 වසරේ ශ්‍රී ලංකා සමාජ සංරක්ෂණ මණ්ඩල කාර්යාල ගොඩනැගිල්ලෙහි ව්‍යුහාත්මක ස්ථාවරත්වය පරීක්ෂා කිරීම සඳහා එම ආයතනය වෙත ලබා දී ඇත. මහා භාණ්ඩාගාරය විසින් අවශ්‍ය උපදෙස් ලබාගෙන මෙම රු.540,000.00 ශේෂය සමාජ ආරක්ෂණ මණ්ඩලය වෙත පවරා දීමට ඉදිරියේ දී කටයුතු කරමි. | නිවැරදිව වාර්තා කිරිමට කටයුතු කළයුතු විම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2021 මාර්තු 26 දින අපහරණ කමිටුව විසින් හදුනාගන්නා ලද වාහන 5 ක් දෙසැම්බර් මාසයේ වෙනත් ආයතනවලට පවරා දී තිබුණද ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කර නොතිබුණි. | වත්කම් ලේඛනයෙන් 2022 වසරේ ඉවත් කිරීමට කටයුතු කරන ලෙස දැනුවත් කරන ලදි. | -එම- |
| (ඊ) | අමාත්‍යාංශය සතු වත්කම් වලින් පිරිවැය රු. 6,626,616 ක් වූ අයිතම 15 කට අදාළ භාණ්ඩ ඒකක 144 ක් වර්ෂය තුළ අපහරණය කල බව ACA 6 හි දක්වා තිබුණද භාණ්ඩ අපහරණය ලැයිස්තුවට අනුව අයිතම 54 කට අදාළ භාණ්ඩ ඒකක 259 ක් ඇති බව අපහරණය කර වාර්තා කර තිබුණි. | භාණ්ඩ අපහරණ ලැයිස්තුව නිවරදිව වර්ගීකරණය කර නොමැති බව අවධාරනය විය. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු අවම කර ගැනීමට කටයුතු කරමි. | -එම- |

1.6.2 **අග්‍රිම ගිණුමේ ශේෂය**

-----------------------

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදි පහත සඳහන්අඩුපාඩු අනාවරණය විය.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| | ---------------------- | -------------------------------- | ----------- |
| **(අ)** | ACA – 3 හි අග්‍රිම ගිණුම් අංකය 7002-0-0-324-21 ලෙස සටහන් විය යුතු වුවත් එය අංක 7002-0-0-324-19 ලෙස සටහන් කර තිබුණි. | අතපසුවීමකින් සිදුවී ඇත. ඉදිරි වර්ෂයේ මේ පිළිබඳ අවධානය යොමු කරන ලෙස විෂයභාර නිලධාරින් දැනුවත් කරන ලදී. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති මාර්ගෝපදේශ ප්‍රකාරව නිවැරදිව මූල්‍ය ප්‍රකශන ඉදිරිපත් කළ යුතු වීම. |
| **(ආ)** | භාණ්ඩාගාර මුද්‍රිත SA-70 ප්‍රකාරව 7002-0-0-324-20 අග්‍රිම ගිණුමේ පෙර වර්ෂයේ රු. 2,241,771 ක ආරම්භක ශේෂය ACA – 3 ආකෘතියට ඇතුළත් කර නොතිබුණි. | රු.2,241,771 ක ආරම්භක ශේෂය ACA-3 ආකෘතියට ඇතුලත් නොකිරීම අතපසුවීමකින් සිදුවී ඇති අතර ඉදිරි වර්ෂයේ දී ගිණුම් පිළියෙල කිරීමේදී නිවරදිව පිළියෙල කිරීමට උපදෙස් දෙන ලදී. | -එම- |

1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශන
-----------------------

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරිමේදි පහත සඳහන්අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි ඉදිරිපත් කරන ලද ආකෘතියෙහි නැවත ගලපන ලද ශේෂ ඇතුළත් කළ යුතු බව දක්වා ඇති නමුදු, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ACA – C මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ රු. 9,372,330 ශුද්ධ ක්‍රියාකාරකම් වටිනාකම නැවත ගැලපීමක් සිදු නොකර මුදල් වල ශුද්ධ වෙනස්වීමක් ලෙස දක්වා තිබුණි. | අතපසුවීමකින් සිදුවී ඇති අතර ඉදිරි වර්ෂයේ මේ පිළිබඳ අවධානය යොමු කරන ලෙස විෂය භාර නිලධාරී දැනුවත් කරන ලදී. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති මාර්ගෝපදේශ ප්‍රකාරව නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කළ යුතු වීම. |

**1.6.4 අත්තිකාරම් ගිණුම් ශේෂ**

**අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම් ගත කිරිමේදි පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.**

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සාමාජික ණය ලේඛනයේ නිලධාරින් 7 දෙනෙකුට අදාළව එකතුව රු. 1,680,826 ක්වූ ණය ශේෂය ගිණුම සමඟ ඉදිරිපත් කර ඇති උපලේඛනයට ඇතුළත්ව නොතිබූ අතර නිලධාරින් 7 දෙනෙකුට අදාළ රු. 1,362,971 ක්වූ ණය ශේෂ එකතුව ගිණුම සමඟ ඉදිරිපත් වූ උපලේඛනයේ ඇතුළත්ව ඇතත් සාමාජික ණය ලේඛනයට ඇතුළත්ව නොතිබුණි. | උපලේඛණයේ ඇතුලත් නොවූ රු.1,680,826 මුදල විශ්‍රාම හා ස්ථාන මාරු වීම් හේතුවෙන් ඇති වූ තත්වයක් වන අතර එම අතපසු වූ සටහන් මේ වන විට නිවරදි කර ඇත. රු.1362971.00 ක ණය ශේෂයන් CC 10 ලේඛනයේ නිවැරදිව සටහන් කිරීමට කටයුතු කර ඇත. | නිවැරදිව වාර්තා කිරිමට කටයුතු කළයුතු විම. |

1.6.5 **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුනු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | හානි හා පාඩු ලේඛනය මුදල් රෙගුලාසි 110 හා 104 ප්‍රකාරව යාවත් කාලීන කර නොතිබුණි. | හානි හා පාඩු ලේඛණය යාවත්කාලීන කිරීම සඳහා කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. | හානි පාඩු ලේඛනය යාවත් කාලීන කල යුතු වීම. |
| (ආ) | මුදල් රෙගුලාසි 94 ප්‍රකාරව බැරකම් හා බැඳීම්වලට එළඹීම පිළිබඳ බැරකම් ලේඛනය යාවත් කාලීන කර නොතිබුණි. | බැරකම් හා බැඳීම් වලට එළඹීම පිළිබඳ බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යන ලෙස විෂය භාර නිලධාරී දැනුවත් කරන ලදී. | බැරකම් ලේඛනය යාවත් කාලීන කල යුතු වීම. |
| (ඇ) | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව අමාත්‍යාංශයේ නිලධාරින් 29 දෙනෙකු ඇප තබා නොතිබුණි. | අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන්ගේ ඇප අයදුම්පත් රාජ්‍ය සේවා අන්‍යොන්‍ය ඇපකාර සංගමය වෙත යොමුකර ඇති අතර පිළිතුරු ලද පසු ඉදිරිකටයුතු සිදුකරනු ලැබේ. | නියමිත පරිදි ඇප තැබිය යුතු විම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය සඳහා වෙන්කර තිබූ රු. 11,458,600,000 ක් වූ මූලධන ප්‍රතිපාදනයෙන් රු. 6,694,694,598 ක් පමණක් උපයෝජනය කර තිබූ අතර රාජ්‍ය වියදම් සමාලෝචනය යටතේ වූ අමාත්‍ය මණ්ඩල උපදෙස් ප්‍රකාරව රු. 451,956,397 ක ඉතිරිය හැරුනු විට ප්‍රයෝජනයට නොගත් ප්‍රමාණය රු. 4,311,949,005 ක් හෙවත් සියයට 37 ක් විය. | 2021 වර්ෂය තුල පැවති කෝවිඩ් වසංගත තත්වය සහ වෙළඳපළ තුල පැවති අමුද්‍රව්‍ය හිඟය, වැඩ බිම් නිරෝධායනය මත වසා තැබීමට සිදුවීම, අතවශ්‍ය භාණ්ඩ හිඟවීම, භාණ්ඩ මිල ඉහල යාම, අක් මුදල් නොලැබීම මත ප්‍රතිපාදන ඉතිරිවීම සහ අතැති බිල් පැවතීම සිදුවිය. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2020 අංක 07 දරන විසර්ජන පනතේ 6 වන වගන්තිය අනුව හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.1 ජේදය අනුව වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් වෙන්කර දී ඇති පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන සීමාවන් තුලම රැදි සිටිමින් වාර්ෂික වියදම් කලමනාකරණය කර ගැනිම සිදු කල යුතු බව දක්වා තිබුණද, පරිපූරක ඇස්තමේන්තු මත රු. මිලියන 5,755 ක් වැය විෂයයන් 2 කට ලබා ගෙන තිබූ අතර දෙසැම්බර් 31 දින වන විට ඉන් සියයට 23.2 ක් හෙවත් රු. 1,337,328,743 ක් ඉතිරි වී තිබුණි. | ප්‍රතිපාදන ඉතිරියට හේතු වන්නේ අදාල ඉදිකිරීම් නිම කිරීම සඳහා කෝවිඩ් වසංගතය සමඟ ඇතිවූ අමුද්‍රව්‍ය හිඟය මූලික වශයෙන් බලපෑම වේ. | -එම- |
| (ඇ) | 2020 අංක 7 දරණ විසර්ජන පනතේ 5(1) හා 5 (2) වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු මුදල් රෙගුලාසි 66 සහ 69 ප්‍රකාරව විරමොං පරිපාටිය අනුගමනය කර ප්‍රතිපාදන ලබා ගෙන තිබුණද, වැය විෂයන් 2 කට අදාලව එසේ ලබාගත් මුදලින් සියයට 37 ක් වර්ෂය අවසාන වන විට උපයෝජනය කර නොතිබුණි. | මු.රෙ 66 සහ 69 ප්‍රකාරව වීරමොං ක්‍රියාපටිපාටිය යටතේ ප්‍රතිපාදන ලබා ගන්නා ලද්දේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලින් ලැබෙන ප්‍රතිපාදන ඉල්ලීම් අනුව වන අතර ඉදිරි වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත අවශ්‍ය ප්‍රතිපාදන පූරෝකථනය කර ලබා දීමට පියවර ගනිමින් ඉදිරි වර්ෂයේදී මෙවැනි දෝෂ ඇති නොවීමට විෂයභාර නිලධාරියා දැනුවත් කරන ලදි. | -එම- |
| (ඇ) | 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි 3.4 ඡේදයට පටහැනිව වැය විෂයය 24 ක ඉතිරිය සියයට 6 සිට සියයට 100 දක්වා පැවතුණි. | 2021 අගෝස්තු 30 දිනැති රාජ්‍ය වියදම් සමාලෝචනය යටතේ වූ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල වීම සඳහා සිදුකල ඉතිරිකිරීම් වේ. | -එම- |
| (ඉ) | මුදල් රෙගුලාසි 138 (1) ප්‍රකාරව වවුචරය සහතික කළ නිලධාරියා විසින් අදාළ වියදම ශිර්ෂය, වැඩසටහන , ව්‍යාපෘතිය ආදියට අදාළ ගිණුමට නිවැරදි වැය බරක් බව සනාථ කළ යුතු වුවද වියදම් ව්‍යාපෘතිය අනුව වර්ග කිරිමේදී ව්‍යාපෘති 02 කට සටහන් කර තිබූ අවස්ථා මෙන්ම වියදම්, වැඩසටහන් අතර සටහන් කිරීමේදී වර්ගීකරණ දෝෂ තිබූ අවස්ථා 79 ක් ද නිරීක්ෂණය විය. | අමාත්‍යාංශය සතු සංචිත වාහන පොදුවේ අමාත්‍යාංශය යටතේ සේවයේ නියතු නිලධාරින් පරිහරණය කරණ බැවින් අදාල වැය විෂයන්ගේ ප්‍රතිපාදන ඉතිරි වී ඇති පරිදි ගිණුම් ගත කොට ඇත. ඉදිරියේ නිසි පරිදි අදාල වැය විෂයන් යටතේ වවුචර් ගිණුම් ගත කිරීමට අදාල නිලධාරින් දැනුවත් කර ඇත. | -එම- |

**2.2** **බැරකම් හා බැඳීම්වලට එළඹීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 9 ක ඉතිරි කිරිම් රු. 380,743 ක් ඉක්මවා රු. 1,551,496 ක බැරකම් ඇති කරගෙන තිබුණි. | විවිධ හේතු මත 2021 වර්ෂය අවසන් වීමෙන් පසුද ගෙවීම් වවුචර ඉදිරිපත් කල බැවිණි. ඒ අනුව දක්වා ඇති වැය විෂයන් සඳහා අතිරේක ප්‍රතිපාදන ඉල්ලුම් නොකර 2022 වර්ෂයේ දී ගෙවීම් සිදු කරන ලදී. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව බැඳීම්වලට එළඹිය යුතු වීම. |
| (ආ) | ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් බැදීම් හා බැරකම් පිළිබඳ තොරතුරු පද්ධතියට UPLOARD කර තිබූ බැරකම් ශේෂය ______________රු. 1,391,475,563 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනයේ වැඩසටහන් අනුව එම වටිනාකම රු. 2,086,571,257 ක් විය. | දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ බැදීම් හා බැරකම් පද්ධතියට ඇතුලත් කර ඇති වටිනාකම රු.1,391,475,563 ක් වුවද ඔවුන් විසින් මෙම අමාත්‍යාංශය වෙත සහතික කර එවා ඇති බැදීම් හා බැරකම් වටිනාකම රු. 2,086,571,257 ක් වේ. ඒ අනුව එම වටිනාකම මූල්‍ය ප්‍රකාශයට ඇතුලත් කරන ලදී. | -එම- |

**2.3** **අත්තිකාරම් පියවීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ හැකියා, ශක්තිය අපේක්ෂිත මෙහෙයුම්වල පරිමාණය සහ අදාළ කටයුත්තේ වියදම් සඳහා රජයට ප්‍රතිපාදනය කළහැකි අරමුදල් ප්‍රමාණය යන කරුණු සැලකිල්ලට ගෙන අත්තිකාරම් ගිණුමේ නියමිත සීමාවන් පැනවීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ වියදමේ උපරිම සීමාව හා හර ශේෂයේ උපරිම සීමාව තත්‍ය අගය පිළිවෙලින් සියයට 19 ක් සහ සියයට 42 ක් විය. | 2021 වර්ෂය සඳහා ඇස්තමේන්තු සකසන අවස්ථාවේදී මෙම අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය 927 ක් වූ අතර එම කාර්ය මණ්ඩලය සැලකිල්ලට ගනිමින් උපරිම වියදම් සීමාව හා උපරිම හර ශේෂ සීමාව තීරණය කරන ලදී. නමුත් අමාත්‍යාංශ සංශෝධනය කිරීමත් සමඟ ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරියට අනුයුක්තව සිටි 272 | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරිමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | ක් වූ සංවර්ධන නිලධාරී කාර්ය මණ්ඩලය මෙම අමාත්‍යාංශයේ විෂය පථයෙන් ඉවත් වීම හේතුවෙන් භාණ්ඩාගාරය විසින් ලබාදුන් සීමාවන් හා තත්‍ය අගයන් අතර මෙම වෙනස ඇති වී ඇත. 2021 වර්ෂය සඳහා සත්‍ය සේවක සංශෝධනය කිරීමටද භාණ්ඩාගාරය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. | |
| (ආ) සේවය හැර ගොස් වර්ෂ දෙකක් ඉක්මවා ඇතත් නිරවුල් නොවූ ණය ශේෂය රු. 202,508 ක් විය. | ණය අය කර ගැනීම සම්බන්ධයෙන් 2021.09.30 ඔහුගේ පෞද්ගලික ලිපිනයට 11 වන සිහිකැඳවීමක් යොමු කර ඇත.<br>ස්ථාන මාරු ලබා මාස 03 ඉක්මවූ වශයෙන් සඳහන් රු.53,200.00 ණය ශේෂය 2022 ජනවාරි මස ගිණුම් සාරාංශය මඟින් නිරවුල් කිරීමට කටයුතු කර ඇත. | ණය මුදල නිරවුල් කිරිමට කටයුතු කළ යුතු වීම. |

**2.4** තැන්පතු ශේෂයන්

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ---------------------------------- | ----------- |
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුම් 2 ක එකතුව රු. 1,814,858 ක් වූ අතර එම ශේෂය තුළ වසර 1 ත් වසර 5 ත් අතර කාලයක් පැරණි රු. 1,059,123 ක තැන්පතු ශේෂයක් විය. 2022 අප්‍රේල් මාසය වනවිට ඉන් රු. 240,000 ක් නිරවුල් කර තිබුණි. | ටෙන්ඩර් තැන්පතු ගිණුමේ රු. 200,000 ක තැන්පතු රාජ්‍ය ආදායමට 2022 අප්‍රේල් මස ගිණුම් සාරාංශයෙන් බැර කිරීමට කටයුතු කර ඇති අතර ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතන දැනුවත් කර රජයේ ආදායමට බැර කිරීමට නිර්දේශ ලද වහාම රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 සහ 2020 වර්ෂයන් වලදී පුහුණු මධ්‍යස්ථානවලින් රැස්කළ රු. 526,472 ක ආදායම සහ නේවාසික පහසුකම් සැපයීම වෙනුවෙන් 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රැස්කල රු. 157,032 ක් රජයේ ආදායමට බැර නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | නිර්දේශ ලද වහාම රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමි. | -එම- |
| (ඇ) | පුහුණු වැඩසටහන් සඳහා ආසියානු පදනමෙන් ලද රු. 211,000 ක් එම පුහුණු වැඩසටහන් සඳහා යොදවා ගැනිමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබු අතර ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | උපදේශන සේවාවේ නියුතු නිලධාරින්ගේ කුසලතා සංවර්ධන පුහුණු වැඩමුළුවක් සඳහා ඉදිරියේදී යොදා ගැනීමට සැලසුම් කර ඇති බව දන්වමි. | සැලසුම් කර ඇති වැඩසටහන් සඳහා යොදා ගැනීමට කටයුතු කල යුතු වීම. |

**2.5** **බැංකු ගිණුම් මෙහෙයවීම**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ---------------------------------------- | ----------- |
| **(අ)** | කිසියම් විශේෂ අත්සන් ලබාදීමේදී ඒ යටතේ ගෙවිය හැකි උපරිම ප්‍රමාණය පිළිබඳ බැංකුවට උපදෙස් ලබා දී නොතිබුණි. | බැංකු ගිණුමක් විවෘත කිරීමේ දී අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග යටතේ භාණ්ඩාගාරය හරහා බැංකුව දැනුවත් කර ඇති අතර, වරින් වර සිදුවන වෙනස් වීම් බැංකුව වෙත ලිඛිතව දැනුම් දීමට කටයුතු කර ඇත. | උපරිම ප්‍රමාණය පිළිබඳ බැංකුවට උපදෙස් ලබා දීමට කටයුතු කල යුතු වීම. |
| **(ආ)** | 2015 ඔක්තෝබර් 15 දිනැති අංක 03/2015 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයේ 02 ඡේදයේ සඳහන් TOD/BA/01 ආකෘතියේ 11 යටතේ සඳහන් කර ඇති පරිදි මු.රෙ. 880 ප්‍රකාරව අමාත්‍යාංශයේ නිලධාරින් 29 දෙනෙකු ඇප තබා නොතිබුණි. | පිලිතුරු ලබාදී නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |
| **(ඇ)** | නරක් වූ හෝ අවලංගු කරන ලද චෙක්පත් පිළිබඳ වාර්තා තබාගැනීමක් සිදුකර තිබු නමුත් එම වාර්තා අභ්‍යන්තර විගණන අංශය වෙත යොමුකර නොතිබුණි. | වාර්තා අභ්‍යන්තර විගණන අංශය වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස විෂයභාර නිලධාරී දැනුවත් කර ඇත. | -එම- |

**2.6 නීති, රිති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

**-----------------------------------------------------**

**නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති, රිති හා රෙගුලාසි වලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.**

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 371(2)ආ | අතුරු අග්‍රිමයක් නිකුත් කිරිමෙන් පසු අදාළ කාර්යය නිම කල විගසම අග්‍රිමය පියවිය යුතු වුවත් අවස්ථා 45 කට අදාලව එකතුව රු. 697,038 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අතුරු අග්‍රිමය ලබාගත් කාර්යය නිමකල විගසම අග්‍රිමය පියවීමට ක්‍රියාකල යුතුබව නිලධාරින් දැනුවත් කරන ලදී. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | මුදල් රෙගුලාසි 1647 (අ) හා 1994 අගෝස්තු 3 දිනැති අංක 26/92 (**1**) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | අමාත්‍යාංශය සතු වාහන **43** ක් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කිරිමට කටයුතු කර නොතිබුණි. | මේ වනවිට සමික්ෂණය අවසන් කර ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | 2016 දෙසැම්බර් 26 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මිලදි ගත් වාහන දෙක සඳහා පැවැත්විය යුතු දෛනික ධාවන සටහන් හෝ මාසික ධාවන වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | එම වාහන 2 සඳහා දෛනික ධාවන සටහන් හා මාසික වාර්තා තබා ගැනීම දැනටමත් සිදුකරන අතර විගණනය සඳහා එම වාර්තා ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | 2019 ජනවාරි 12 දිනැති අංක DMA 01/2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | වැටුප් ගෙවීම සම්බන්ධ උපදෙස් පත්‍රිකාවේ වැටුප් සකස්කිරීම් පරිගණක මෘදුකාංගයට අදාළ පලමු, දෙවන හා තෙවන මුරපද (Pass Ward) නිලධාරින් අතර බෙදා දිය යුතු බව දැක්වුවද එසේ සිදුකර නොතිබුණි. | වැටුප් සම්බන්ධ පරිගණක මෘදුකාංගයට අදාල පළමු දෙවන හා තෙවන මුරපද අදාල නිලධාරීන් අතර බෙදා දීම සඳහා කටයුතු කරමින් පවතී. | විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රම අනුගමනය කළ යුතු වීම. |
| (ඉ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ආයතන අතර වත්කම් මාරු කිරීම හා පැවරීම සම්බන්ධයෙන් වත්කම්වල පොත් වටිනාකම ඇතුලත් | අමාත්‍යාංශයේ අපහරණ කමිටුව මඟින් අපහරණයට නිර්දේශ කරන ලද | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | ලේඛනයක් සැකසීම , එය මාරු කිරීම් පැවරීම් ආයතන වෙත ලබාදීම , වත්කම් තක්සේරු කිරීම ,ගැලපීම යනාදී කටයුතු සිදුකල යුතු වුවත් අමාත්‍යාංශය විසින් වත්කම් පැවරීම සිදුකිරීමේදී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රථ 5 ක් තක්සේරු කමිටු වාර්තාවද ලබා ගැනීමෙන් පසුව නිත්‍යානුකූලව පවරා දීම සිදු කර ඇති අතර ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරමින් පවතී. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අමාත්‍යාංශයේ මෙහෙවර**

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 ඔක්තෝබර් 06 දිනැති අංක 2196/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් රාජ්‍ය අමාත්‍යාංශය විසින් සිදුකල යුතු කාර්යයන් හා කර්තවයන්ද සුවිශේෂී ප්‍රමුඛතා 5 ක් ද හඳුන්වා දී තිබුණි. එම සුවිශේෂී ප්‍රමුඛතා ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවස්ථාපිත ආයතන 3 ක් වන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අධිකාරිය සහ රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව යන ආයතනවල පාලන බලය අමාත්‍යාංශය වෙත පවරා තිබුණි. එහෙත් රාජ්‍ය අමාත්‍යාංශය විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසාය ප්‍රාග්ධන සමාගම හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අධිකාරිය යන ආයතන දෙකට අදාළ මෙහෙයුම් කටයුතු පිළිබඳව තොරතුරු සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් විමසා තිබුණද එම ආයතන පිළිබඳ තොරතුරු ලබාගත නොහැකි වී තිබුණි. | මෙම ආයතන දෙක පිළිබඳ තොරතුරු ලබාගත නොහැකි විය. ඒ පිළිබඳ ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව හා ඉදිරි පියවර පිළිබඳව ගැටළු සහගත තත්වයකට පත්වී ඇති බැවින් ඒ පිළිබඳ දැනුවත් වීම සඳහා සුදුසු නිලධාරීන් සමඟ සාකච්ඡාවක් සූදානම් කර දෙන මෙන් ලේකම් අත්සනින් යුතුව SMS/ACC/17/1/SME අංක දරණ ලිපිය මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. | අමාත්‍යාංශය විසින් සිදුකල යුතු කාර්යයන් හා කර්තවයන්ට අදාල මෙහෙයුම් කටයුතු සිදු කල යුතු වීම. |

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථා සමාගම සතුව 2021 ජුලි 15 දිනට රු. 1,521,370 ක බැංකු වාසි සහගත ශේෂයක් ද, රු. 61,928,356 ක ස්ථාවර තැන්පතුවක් පැවතුණි. සී/ස රබර් අපනයන සංස්ථාවට හිමිකාරත්වය ඇතිව කළමනාකාරිත්වය පමණක් මෙම සංස්ථාවට පැවරී ඇති වත්කම් 3 ක් බදු දීමෙන් වසරකට රු. 10,849,164 ක බදු ආදායමක් සංස්ථාව විසින් 2021 ජුලි 15 දිනට උපයා තිබුණද මෙම සංස්ථාව පාලක මණ්ඩලයක් සහිතව ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින බව අමාත්‍යාංශයේ ලේකම් විසින් මුදල් අමාත්‍යාංශය වෙත දන්වා තිබුණි. එමෙන්ම සංස්ථාව සතුව පවතින ඇල්පිටිය කර්මාන්තශාලාව වසර 20 ක් පුරා වසා දමා ඇති බවත් මෙම සංස්ථාවට අයත් වත්කම් වගකීම් පිළිබඳ වාර්තා නීතිමය වශයෙන් තහවුරු කර ගැනීමට ලිඛිත ලියවිලි අමාත්‍යාංශය සතු නොවන බවත් තවදුරටත් මුදල් අමාත්‍යාංශය වෙත අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වා තිබුණි. | රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවේ ඉදිරි මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡාවක් 2021 ජුලි 22 දින මුදල් අමාත්‍යාංශයේදී පැවතිණි. එම සාකච්ඡාවෙන් පසුව සංස්ථාව PED/P/SRMC/1/11(i) අංක දරණ 2021 සැප්තැම්බර් 10 දිනැති ලිපි පිටපතෙහි සඳහන් පරිදි දැනට අක්‍රියව පවතින සී/ස රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව කඩිනමින් ඇවර කරන ලෙස මුදල් අමාත්‍යාංශයේ ලේකම් දැනුම් දුන් බව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම් දී ඇත. එම ලිපියට පිළිතුරු වශයෙන් රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව ඇවර කිරීමේ කටයුතු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමන්තුව හා භාණ්ඩාගාර නීති දෙපාර්තමේන්තුවේ සෘජු අධීක්ෂණය යටතේ සිදු කිරීමට හැකි නම් එය වඩාත් යෝග්‍ය බව යෝජනා කරමින් උපදෙස් පතා SMS/SRMC/ACC/16/2 අංක දරන ලිපියක් මුදල් අමාත්‍යාංශය වෙත 2021 සැප්තැම්බර් 24 දින ඉදිරිපත් කරන ලදී. | -එම- |

**3.2 කාර්ය සාධනය**

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය**<br>අන්ත දිළින්දන් ක්‍රමිකව ඉසුර කරා රැගෙන යාමේ අරමුණින් තෝරාගත් දිස්ත්‍රික්ක 3 ක ප්‍රතිලාභීන් 165 ක් ඉලක්ක කරගෙන රු. මිලියන 16.08 ක් ප්‍රතිපාදනය කර තිබූ අතර 2021 දෙසැම්බර් 31 දින වන විට ප්‍රතිලාභීන් 108 ක් වෙනුවෙන් රු. මිලියන 10.52 ක ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි. | ව්‍යාපෘතිය ආරම්භ කරන අවධියේ පැවතුණු කෝවිඩ් වසංගත තත්ත්වය යටතේ දුරබැහැර ගමනාන්ත සීමාකර තිබූ බැවින් එක් දවසක් තුළ රාජකාරි කටයුතු අවසන් කළ හැකි කොළඹ, | ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා පදනම් වූ කරුණු හා තෝරා ගැනීමේ ක්‍රමවේදය සහ නියමු ව්‍යාපෘතියේ ඵලදායිත්වය ඇගයීමේ ක්‍රමවේද සකස් කල යුතු විම. |

| | | | |
|---|---|---|---|
| | මෙම නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී දිස්ත්‍රික්ක තුන තෝරාගැනීම සසම්භාවීව සිදුකර තිබූ අතර, ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා පදනම් වූ කරුණු හා තෝරා ගැනීමේ ක්‍රමවේදය සහ නියමු ව්‍යාපෘතියේ ඵලදායිත්වය ඇගයීමේ ක්‍රමවේදය පිළිබඳව විගණනයට ප්‍රමාණවත් තොරතුරු අනාවරණය නොවුණි. | කුරුණෑගල, ගම්පහ යන දිස්ත්‍රික්ක තෝරා ගත් අතර සසම්භාවී නියැදි ක්‍රමය භාවිතා කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සහ ග්‍රාම නිළධාරී කොට්ඨාශ තෝරා ගන්නා ලදී. | |
| **(ආ)** | වෙනත් රේඛීය අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා ආයතන හරහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා ලබාදුන් රු. 672,100,000 ක ප්‍රතිපාදන<br>------------------------------------------------<br>සමෘද්ධි රාජ්‍ය අමාත්‍යාංශයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව රු. මිලියන 773.9 ක් විවිධ ආයතන වෙත ප්‍රතිපාදන ලෙස වෙන්කර ව්‍යාපෘති 22,215 ක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණද 2021 වර්ෂයේ 4 වන කාර්තුවේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවට අනුව ව්‍යාපෘති 13,020 ක් නිම කිරීමට රු. මිලියන 686.66 ක් වැයකර තිබුණි. නිම කරනලද ව්‍යාපෘති වලට අදාලව අක්මුදල් ලැබීමේ ප්‍රමාදය හේතුවෙන් මිලදීගත් භාණ්ඩ හා උපකරණ සහ වෙනත් වියදම් වෙනුවෙන් අතැති බිල්පත් වටිනාකම රු. 75,625,000 ක් විය. | ඉල්ලීම් කරන ලද ආයතන සඳහා අදාල ප්‍රතිපාදන නිදහස් කරන ලද අතර එම විෂයභාර ආයතනවල ව්‍යාපෘති සැලසුම් අනුව එක් එක් ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන යොදාගැනීම සිදුකරන ලදී. මීට අමතරව අනෙකුත් ආයතන වලට අදාල ව්‍යාපෘති ප්‍රාදේශීය ලේකම්වරුන් මගින් ක්‍රියාත්මක කිරීම සිදුකරන ලදී. | සැලසුම් කර ඇති වැඩසටහන් සඳහා යොදා ගැනීමට කටයුතු කල යුතු වීම. |
| **(ඇ)** | සෞභාග්‍යා ජාතික ගම්මාන සවිබල ගැන්වීමේ වැඩසටහන<br>------------------------------------------------<br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.<br><br>(i) සෞභාග්‍යා සමෘද්ධි නිෂ්පාදන ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් රු. මිලියන 1,800 ක් වැයකර ව්‍යාපෘති 1,250 ක් ක්‍රියාත්මක කිරීමට ඉල්ක්කගත කර තිබුණි. දෙසැම්බර් 31 දිනට වූ ප්‍රගති වාර්තා අනුව ව්‍යාපෘති 1,591 ආරම්භකර ඇති බවත් ඉන් ව්‍යාපෘති 1,436 ක් වෙනුවෙන් රු. මිලියන 733.92 ක් වැයකර ඇති බවත් රු. මිලියන 819.22 ක අතැති බිල් ඇති බවත් දක්වා තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යලවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අක්මුදල් ඉල්ලුම් කිරීම | මෙම රු. මි 246.86 ක ප්‍රතිපාදන ප්‍රමාණය ඉතිරි වීමට හේතු වුයේ ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ඉහල යාම, වෙළඳපොළ භාණ්ඩ හිඟවීම මත කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් වී නොතිබීම වැනි හේතුන් වේ. | -එම- |

| | | | |
|---|---|---|---|
| | වර්ෂය අවසානයේදී සිදුකර තිබීම හේතුවෙන් ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණු අතර ප්‍රතිපාදන මුදලින් රු. මිලියන 246.86 ක් ඉතිරි වී තිබුණි. | | |
| (ii) | නිෂ්පාදන ක්ෂේත්‍ර හඳුනාගැනීම හා ගම්මාන තෝරා ගැනීමේදී එක් එක් ගම්මානයන්හි පවතින සම්පත් සුලභතාව, නිෂ්පාදන විෂමතාව හා තිරසරව ක්‍රියාත්මක කිරීමේ හැකියාව හෝ පවතින නිෂ්පාදනයක් මූලික කරගනිමින් හෝ ගම්මාන තෝරාගැනීම කලයුතු බවත් නිෂ්පාදන අඛණ්ඩව කරගෙනයාම සඳහා අමුද්‍රව්‍ය බහුලව පැවතීම, භූගෝලීය/ දේශගුණික ප්‍රදේශ අනුව වඩා යෝග්‍යතම නිෂ්පාදන ධාරිතාව වැඩිකිරීමට පවතින විභවතාවයක් තිබීම යනාදී අවධානය යොමුකල යුතු විශේෂිත කරුණු කෙරේ අවධානය යොමු නොකොට ගම්මාන තෝරා ගැනීම සිදුකර ඇති බවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කිහිපයක සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය. උදා : හෝමාගම - පොල් ආශ්‍රිත නිෂ්පාදන ගම්මාන | නිෂ්පාදන කටයුත්තක් ක්‍රියාත්මක කිරීමේ දී ඊට සම්බන්ධ වන ජනතාවගේ කැමැත්ත ඉතා ප්‍රබල සාධකයක් වේ. එබැවින් ජනතා කැමැත්ත පදනම් කරගෙන බොහෝ දුරට නිර්ණායක සමඟින් ද ගැළපීම් කරගනිමින් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් නිශ්පාදන ගම්මාන තෝරා ගෙන ඇත. කෙසේ වෙතත් ඉදිරියේදී ගම්මාන හඳුනා ගැනීමේදී නිර්ණායක කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |
| (iii) | කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සිදුකරන ලද නියැදි පරීක්ෂාවට අනුව චක්‍රලේඛ ප්‍රකාරව තනි පුද්ගලයෙකු සඳහා රුපියල් ලක්ෂයක් පමණක් ලබාදිය යුතු වුවද එක් යන්ත්‍රයක වටිනාකම රු. 605,000 ක් වන පොල්තෙල් නිෂ්පාදන යන්ත්‍ර 8 ක් ප්‍රතිලාභින් 8 දෙනෙකු වෙනුවෙන් ද ප්‍රතිලාභින් දෙදෙනෙකු වෙනුවෙන් පොල්ලෙලි කැබලි කිරීමේ යන්ත්‍රයක් ලබාදිය යුතු වුවද රු. 175,000 ක් වටිනා පොල්ලෙලි කපන යන්ත්‍රයක් එක් ප්‍රතිලාභියෙකුටත් ලබා දී තිබුණි. එහෙත් අවශ්‍ය අමුද්‍රව්‍ය නොමැතිවීම නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි තත්ත්වයක පවතින බව 2021 දෙසැම්බර් 14 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | සෞභාග්‍යා පොල්තෙල් නිෂ්පාදන හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් ප්‍රවර්ධනය කිරීමේ සමිතිය වෙත නිකුත් කර ඇති අතර ඉන් අනතුරුව කර්මාන්තය කරගෙන යාමේ අරමුණින් සමිතියේ සාමාජිකයින් වෙත බෙදා දී ඇත. කිසිඳු උපකරණයක් පුද්ගලිකව සාමාජිකයින් වෙත ලබා දී නොමැත. එහි මෙහෙයුම් හා අධීක්ෂණ කටයුතු සෞභාග්‍යා සමිතිය මඟින් සිදු කරනු ලබයි. | -එම- |

**(ඇ) සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ආශ්‍රිත - පොදු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම**

**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| (i) පොදු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේදී 2021 වර්ෂය තුළ වැඩ අවසන් කිරීමට හැකි යෝජනා පමණක් තෝරාගත යුතු බවත් ඉදිරි වර්ෂය සඳහා අවිච්ඡේද නොකරන බව දන්වා තිබියදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 ක ව්‍යාපෘති 5 කට අදාලව එකතුව රු. 8,995,587 කට අදාලව අතැති බිල්පත් විය. | වර්ෂ අවසාන කාලයේ දී පැවති ඉදිකිරීම් අමුද්‍රව්‍ය වල හිඟතාවය, අක්මුදල් නොලැබීම වැනි කරුණු මත ඉදිකිරීම් ව්‍යාපෘති වල යම් ප්‍රමාදයක් සිදුව ඇත. | -එම- |
| (ii) තිඹිරිගස්යාය, කිරුළපන කොළකැඳ/ හෙල ඔසු නිෂ්පාදනය යන සෞභාග්‍යා නිෂ්පාදන ව්‍යාපෘතියෙහි ප්‍රමුඛතම අවශ්‍යතාවය ලෙස නව නිෂ්පාදනාගාරයක් ඉදිකිරීමට හඳුනාගෙන තිබුණද එම අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමුනොකර සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදිත රු. 3,000,000 ක මුදලින් රු. 1,488,402 ක් වැය කර පවතින නිෂ්පාදනාගාරය ආසන්නයේ ඇති අබලන් වූ මාර්ගය අළුත්වැඩියා කර රු. 1,511,598 ක්වූ ඉතිරි මුදල් අමාත්‍යාංශය විසින් ආපසු ලබාගෙන තිබුණි. ඒ අනුව සෞභාග්‍යා නිෂ්පාදන ගම්මානවල ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනයට සෘජුව දායකවන පොදු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණ ඉටුවී නොමැතිබව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේ දී අමුද්‍රව්‍ය හිඟය, ආනයන සීමාකිරීම්, වෙළෙඳපොල මිළ ගණන් උච්ඡාවචනය වීම මත වරින්වර ඇස්තමේන්තු සංශෝධනය වීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ ප්‍රතිපාදන වලින් රු 1,511,598 ක ප්‍රතිපාදන කොළඹ දිස්ත්‍රික් ලේකම් විසින් නැවත පවරා දී ඇත. | -එම- |
| (iii) 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොන්ත්‍රාත් පැවරීම නිර්දේශ කිරීමේදී අදාළ කොන්ත්‍රාත්කරුට මූල්‍ය පහසුකම් ඇති බවට බැංකු ප්‍රකාශන මඟින් සනාථ කර ගත යුතුය. තවද කොන්ත්‍රාත්කරුගේ පළපුරුදුකම් වැඩ පිළිබඳ ප්‍රමිතය පිළිබඳව සෑහීමකට පත්විය හැකි සාක්ෂි පැවතිය යුතු අතර අවුරුද්දකට පෙර පිරිනමා ඇති නමුත් අසම්පූර්ණ කර ඇති කොන්ත්‍රාත් | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව වගකීම පැවරී ඇත්තේ අදාළ වැඩසටහන ක්‍රියාත්මක කරන ආයතනයටය. තව ද මෙම අමාත්‍යාංශය මඟින් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේ දී අදාළ රෙගුලාසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන, දෙපාර්තමේන්තු උපදෙස් හා රජය මඟින් | -එම- |

| | | | |
|---|---|---|---|
| | පිළිබඳව සහ අදාළ කාර්ය උප කොන්ත්‍රාත් නොදෙන බවට සමිතිය විසින් නිකුත් කල ප්‍රකාශ පිළිබඳව දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මඟින් සෑහීමකට පත්වන්නේ නම් කොන්ත්‍රාත් පිරිනැමිය හැකි බව දන්වා තිබුණි. එහෙත් හෝමාගම, පාදුක්ක සහ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ ව්‍යාපෘති සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර ඇති බව නිරීක්ෂණය නොවුණි. | කලින් කලට නිකුත් කරනු ලබන උපදෙස් වලට අනුකූලව කටයුතු කරන ලෙස අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන දැනුවත් කර ඇත. | |
| (iv) | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ආශ්‍රිත ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනයට සෘජුවම දායකත්වයක් ලබාදෙන යටිතල පහසුකම් සැපයීම මෙම ව්‍යාපාතියේ අරමුණ වුවත් එයට පටහැනිව සෞභාග්‍යා නිෂ්පාදන ගම්මානවලින් බැහැර ප්‍රදේශවල මාර්ග ඉදිකිරිම සහ පැති බැම් හා කාණු පද්ධතිය සැකසීම, විශේෂ ව්‍යාපෘති වශයෙන් නම්කර සමාලෝචිත වර්ෂයේ දී ව්‍යාපෘති 4 ක් සඳහා රු. 5,306,972 ක් වැය කර තිබුණි. | මෙය හුදෙක්ම නිෂ්පාදන ගම්මාන වලට පමණක් සීමා වූ වැඩසටහනක් නොවන අතර මෙම ව්‍යාපෘතීන් ප්‍රදේශයේ මහජන ඉල්ලීම් මත දීර්ඝ කාලයක් පුරාවට සංවර්ධනය කිරීමට නොහැකිව පැවති ප්රදේශයේ ජනතාවගේ සංවර්ධනයට ඉවහල් වන පොදු යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන් වේ. | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු විම. |
| **(ඉ)** | ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ආයතනය<br>-------------------------------------------------<br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | සමෘද්ධි නිෂ්පාදන ගම්මාන හා සෞභාග්‍යා නිෂ්පාදන පොකුරු ගම්මාන වැඩසටහන යටතේ තෝරාගත් ආදර්ශ ගම්මාන 50 ක් තුල ප්‍රජාවගේ ජීවන තත්ත්වයේ සිදු වී ඇති වෙනස්කම් පිළිබඳව පර්යේෂණයක් සිදුකිරීම ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත්ව තිබුණද අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට ආදර්ශ ගම්මාන 25 ක් පිළිබඳව පමණක් පර්යේෂණයට භාජනය කර තිබුණි. | රටේ උද්ගත වී පැවති කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව සැළසුම් කල පරිදි ව්‍යාපෘතීන් සිදු කිරීමට නොහැකි විය. | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු විම. |

| | | | |
|---|---|---|---|
| (ii) | ශ්‍රී ලංකාව තුළ ග්‍රාම සංවර්ධන හා දිළිඳුකම පිටු දැකීමේ අරමුණින් ආයතනයේ ක්‍රියාකාරි සැලැස්මට හා අයවැය ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය සඳහා වෙන් වී ඇති රු. මිලියන 50.36 ක මුදලින් ආයතනයේ අරමුණු ඉටුකරගැනීම වෙනුවෙන් වූ ක්‍රියාකාරකම් 8 ක් වෙනුවෙන් ප්‍රතිපාදන මුදලින් සියයට 1.6 ක් හෙවත් රු. මිලියන 0.83 ක් පමණක් වෙන්කර තිබුණි. ඉතිරි සියයට 82.6 ක ප්‍රතිපාදිත මුදලින් සියයට 10.6 ක් ගොඩනැඟිලි අළුත්වැඩියා හා කාර්යාල උපකරණ මිලදී ගැනීමටත්, සියයට 72 ක් පුනරාවර්තන වියදම් සඳහාත් වැයකර තිබුණි. බාහිර ආයතන වලට සේවා සැපයීමෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 538,378 ක ආදායමක් ලබාගෙන තිබුණු අතර මෙම ආයතනය පිහිටුවීමේ අරමුණු හා කාර්යභාරයක් වෙනුවෙන් ඍජුව වැය කරන ලද මුදල සියයට 1.6 ක් පමණක් විය. | බොරැල්ල ප්‍රධාන කාර්යාලය වසර ගණනාවක් පුරා අළුත්වැඩියා සිදු නොකිරීම නිසා එම කටයුතු මෙම වර්ෂය තුළ සිදු කළ අතර බොරැල්ල හා පිළිමතලාව ආයතන බාහිර සේවා සැපයීමෙන් රජයට ආදායමක් ලබා ගත හැකිවන අයුරින් වැඩිදියුණු කොට ආදායම් ලබා ගැනීමේ අරමුණින් එම නේවාසිකාගාර සඳහා උපකරණ මිළදී ගැනීමටද 2021 වර්ෂය තුළ මුදල් වියදම් කිරීමට සිදු විය. | -එම- |

## 3.3 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | --------------------------------- | ------------ |
| (අ) | සමෘද්ධි රාජ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අමතරව ශීර්ෂ 240 යටතේ පරිපූරක ඇස්තමේන්තු මගින් සමෘද්ධිලාභී පවුල් ලක්ෂ දෙකක් සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 5,750 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. ඉන් රු. 4,691,980,006 ක් සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිදහස් කර තිබූ අතර නිදහස් කරන ලද මුළු ප්‍රතිපාදනවලින් රු. 102,071,740 ක් ආපසු පවරාගෙන තිබුණි. වැයකරන ලද මුදලින් රු. 433,337,832 ක් 2021/2022 ගෙවතු වගා වියදම් සඳහා වැයකර තිබුණි. | ලබා දෙන ලද රුපියල් මිලියන 5,750 ක ප්‍රතිපාදන දිස්ත්‍රික්ක හා අනෙකුත් රේඛිය අමාත්‍යාංශ හා ආයතන වෙත ලබා දෙන ලදී. දිස්ත්‍රික්ක 25 ට ලබා දෙන ලද ප්‍රතිපාදනවලින් රු. 102,071,740 ක් ආපසු පවරා ගෙන මෙම වැඩසටහන සඳහා රජය වෙන් කරන ලද ප්‍රතිපාදන උපරිමයෙන් ව්‍යාපෘති සඳහා යෙදවීමට අමතර ප්‍රතිපාදන ඉල්ලුම් කරන ලද දිස්ත්‍රික්ක සඳහා එම ප්‍රතිපාදන නිදහස් කරන ලදී. | සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු විම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමෘද්ධිලාභී පවුල් ලක්ෂ දෙකේ ව්‍යාපෘතිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් රු. මිලියන 33.5 ක ප්‍රතිපාදනවලින් වැඩසටහන යටතට නොගැනෙන ප්‍රධාන කාර්යාලයේ අවශ්‍යතාවය සඳහා තේක්ක අල්මාරි 02 ක් මිලදී ගැනීම සහ කාර්යාල මේස රෙදි මිලදී ගැනීම වෙනුවෙන් රු. 227,788 ක්ද සමෘද්ධි රන්පත් සහතිකපත් මුද්‍රණය කිරීම වෙනුවෙන් රු.7,143,750 ක්ද දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණි. සමෘද්ධි රන්පත් සහතික ප්‍රදානය කිරීම පිළිබඳව විධිමත් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | 2021 වර්ෂයේ "සමෘද්ධි ප්‍රතිලාභී පවුල් 200,000 ක් කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් හා ආශ්‍රිත ගම්මාන බල සම්පන්න කිරීම" ලෙස අයවැය යෝජනාවක් ලෙස ඇතුලත් කර ඇත. | -එම- |

3.4 **හානි හා පාඩු පිළිබඳ පරීක්ෂාව**

**--------------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| | ------------------------ | ---------------------------------------- | ------------- |
| **(අ)** | 2014 සැප්තැම්බර් 24 දින අනතුරට පත් වූ වාහනය සම්බන්ධයෙන් මු.රෙ. 104 (3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාව අනතුර සිදුවී වසර 2 කට පසු ඉදිරිපත් කර ඇති අතර මු.රෙ. 104 (4) ප්‍රකාරව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීම හා මු.රෙ. 105,106 ප්‍රකාරව ක්‍රියාකිරීම අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබුණි. 2021 දෙසැම්බර් 31 දක්වා වසර 7 කට වැඩි කාලයක් ගත වී තිබුණද අනතුරට පත් මෙම වාහනය අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණු අතර අනතුර සම්බන්ධව රක්ෂණ වන්දි ඉල්ලුම් කිරීම වසර 6 කට පසුව 2020 ඔක්තෝබර් 26 දින දී අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශයෙහි මෙම අනතුර සම්බන්ධ කරුණු වාර්තා කර නොතිබුණි. | 2017 පෙබරවාරි 09 දින මූලික පරීක්ෂණය සිදු කර වාර්තාව ඉදිරිපත් කර ඇත. හදිසි අනතුරු වන්දිය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ඉල්ලීම් අදාළ ලේඛන සමඟ ඉදිරිපත් කර ඇත. හානි හා පාඩු ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතු වීම**.** |
| **(ආ)** | රාජ්‍ය අමාත්‍යවරයාගේ සම්බන්ධිකරණ ලේකම්වරයාට අනුයුක්ත කරන ලද නිල රථය 2021 අප්‍රේල් 17 දින අනුරාධපුර | මෙම කාලසීමාව තුල කොවිඩ් වසංගතය දරුණු ලෙස පැවති අතර, සංචරණ සීමා පනවා තිබු | -එම- |

| | | | |
|---|---|---|---|
| | දහයියාගමදී අනතුරකට පත්ව තිබුණු අතර කැබ්රථයේ නියෝජිත ආයතනය විසින් අළුත්වැඩියා වියදම රු. 371,945 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. රක්ෂණ වන්දි වශයෙන් රු. 263,508 ක් ලැබී තිබුණි. අළුත්වැඩියා වියදමෙහි ඉතිරිය වන රු. 108,411 ක් අමාත්‍යාංශය විසින් නියෝජිත ආයතනය වෙත ගෙවා තිබු අතර අනතුරට අදාල මු.රෙ. 104 (3) ප්‍රකාරව විමර්ශනයක් අනතුර සිදුවි මාස 6 කට පසු එනම් 2021 සැප්තැම්බර් 29 දින සිදුකර තිබුණි. | හෙයින් හා රියදුරා කොවිඩ් ආසාදනය වීම හේතුවෙන් පරීක්ෂණ කටයුතු ප්‍රමාද විය. | |
| **(ඇ)** | වාහන 2 ක් අවස්ථා 3 කදී අනතුරුට පත් වීම සම්බන්ධයෙන් මු.රෙ. 104 (4) ප්‍රකාරව පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | අනතුරට පත් වූ වාහන 02 කුමක්ද යන්න පිළිබඳව විස්තර ලබා දී නොමැති බැවින් තොරතුරු සොයා ගත නොහැක. | -එම- |
| **(ඈ)** | 2021 මාර්තු 10 දින අනතුරුට පත් වීමෙන් ජීප්රථයකට රු. 18,400 ක් වු හානිය පිළිබඳව මු.රෙ. 110 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුළත් කර නොතිබුණි. | හානි හා පාඩු ලේඛනයේ සටහන් කර තිබුනද අතපසුවීමකින් තොරතුරු ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර නොමැත. | -එම- |
| **(ඉ)** | 2020 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා මඟින් අනාවරණය වූ රු. 138,000 ක්වූ රාජ්‍ය අමාත්‍ය කාර්යාලයේ Dialog I phone 64 GB (90) 01 දුරකතනයේ ඌනතාවය හානි හා පාඩු පිළිබඳ ලේඛනයේ ඇතුළත් කර නොතිබුණු අතර මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාකර නොතිබුණි. | 2022 අප්‍රේල් 20 දින හිටපු අමාත්‍යවරයා එම දුරකතනය අස්ථාන ගත වී ඇති බවට දුරකථනයෙන් දැන්වූ අතර ඊට අදාල පොලිස් වාර්ථාව ලබා දෙන බවද දන්වා ඇත. | -එම- |

3.5 **ප්‍රසම්පාදනයන්**

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරික්ෂණය** ---------------------- | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** ------------------------------------ | **නිර්දේශය** ------------ |
|---|---|---|
| **(අ)** ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ) සහ 4.2.2 (අ) ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව සහ ප්‍රසම්පාදන කාල සටහන ඇතුළත් වන පරිදි පිළියෙල කර නොතිබුණි. | ඉදිරි ප්‍රසම්පාදන සැලැස්ම සැකසීමේ දී දක්වා ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළයුතු විම. |

| | | |
|---|---|---|
| **(ආ)** රජයේ අනුමත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව අවස්ථා 10 කදි එකතුව රු. 11,037,137 ක් වටිනා කාර්යාල උපකරණ , පරිගණක හා පරිගණක උපකරණ 2021 ජුලි 05 දිනැති අංක අමප/21/1118/313/036 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් මිලදී ගෙන තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය වානිජ විවධ නීතිගත සංස්ථාවෙන් 2021 ජුලි 05 දිනැති අමප/21/1118/313/036 හා 2020 ජුනි 18 දින අමප/20/08887/218/011 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා මගින් රු.මිලියන 50 දක්වා භාණ්ඩ මිලදී ගැනීමට ලබා දී ඇති අමාත්‍ය මණ්ඩ අනුමැතිය මත එම ආයතනයෙන් මිල ගණන් කැඳවා පරිගණක හා පරිගණක උපකරණ මිලදී ගැනීමට කටයුතු කරන ලදි. | -එම- |

4 **වත්කම් කළමනාකරණය**

**-------------------------**

පහත සඳහන් කරුණු නිරික්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | -------------------------------------- | ------------ |
| **(අ)** 2020 වන විට ප්‍රජාපාලිත හා නිෂ්පාදන සේවා අභිමුඛ ග්‍රාම නිලධාරි වසම් 5,000 ක් ඇති කිරීම තුළින් එම ග්‍රාම තුළ ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා ජනතාවගේ මාසික ආදායම දෙගුණකිරීම අරමුණින් ජනාධිපති ලේකම් කාර්යාලය මගින් ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා 2017, 2018 හා 2019 වර්ෂවල ප්‍රතිපාදන ලබාදී තිබුණි. 2020 ජුනි 30 දින වන විට ලබා දී ඇති ප්‍රතිපාදන එකතුව රු. මිලියන 2,391.90 ක් විය. 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශිය ලේකම්වරුන් විසින් එවන ලද වාර්තා අනුව දිස්ත්‍රික්ක 12 ක පිහිටුවා ඇති ග්‍රාමශක්ති සමිති සංඛ්‍යාව 1975 ක් වු අතර එදිනට පවතින මුදල් ශේෂය රු. 791,789,538 ක් සහ ග්‍රාමශක්ති කාර්යාංශයට අදාලව අය වියයුතු ක්ෂුද්‍ර මූල්‍ය ණය ශේෂය රු. 200,394,099 ක්ද විය. එම සමිතිවලින් වර්තමානය වනවිට සමිති 999 ක් අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යොමුකරන ලද අංක SDB/03/GS/Dist-02 හා 2021 නොවැම්බර් 11 දිනැති ලිපිය මගින් සක්‍රීයව ක්‍රියාත්මක වන සමිති වන ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක කල යුතු බවට උපදෙස් ලබා දී ඇත. | ග්‍රාමශක්ති සමිති ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කළ යුතු විම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ග්‍රාම ශක්ති කාර්යාංශය සතුව විවිධ අයිතම් වර්ග 49 කට අදාල කාර්යාල උපකරණ ඒකක 519 ක් පැවති අතර එම කාර්යාල උපකරණවලින් අයිතම් 14 කට අදාල භාණ්ඩ ඒකක 38 ක් පමණක් සෞභාග්‍යා කාර්යාංශය වෙත පවරාගැනිමට කටයුතු කර තිබුණි. ඉතිරි වත්කම් පවරා ගැනිමට කටයුතු නොකර 2021 වර්ෂයේ සෞභාග්‍යා කාර්යාංශය වෙනුවෙන් කාර්යාල උපකරණ මිළදි ගැනිම සඳහා රු. 5,717,938 ක් වැය කර තිබුණි. | 2021 වර්ෂයේ රු.මි. 5300 ක් සඳහා වූ සෞභාග්‍යා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපුරා ගැනීම සඳහා මෙම වැය කිරීම් සිදු කර ඇත. | වත්කම් පවරා ගැනිමට කටයුතු කිරිමටත් සැලසුම්කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කිරිමටත් කටයුතු කළ යුතු විම. |
| (ඇ) | අමාත්‍යාංශයට අයත්වන ආයතන වෙනස්වීම්වලට පෙර වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති ග්‍රාම ශක්ති කාර්යාලයේ කටයුතු මෙම අමාත්‍යාංශයට අයත් සෞභාග්‍යා කාර්යාංශය ලෙස අනුයුක්ත කර තිබුණි. එහෙත් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ග්‍රාම ශක්ති කාර්යාලයට ලබාදි තිබූ ඩබල් කැබ්රථය හා වෑන් රථය සෞභාග්‍යා කාර්යංශය වෙත ලබා දී නොතිබුණි. | අංක SMS/ADM/TRS/02 පොදු හා 2020 සැප්තැම්බර් 17 ලිපියෙන් වතු නිවාස හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය වෙත වාහන ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීම එම අමාත්‍යාංශය මගින් ඉටු කිරීමට නොහැකි බව දැන්වූ බැවින් මගේ සමාංක 2020 ඔක්තෝබර් 09 දිනැති ලිපියෙන් මෙම අමාත්‍යාංශය වෙත අදාල වාහන ලබා දෙන ලෙස ජනාධිපති කාර්යාලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. මෙතෙක් පිළිතුරු නොලැබුන බව දන්වමි. | වත්කම් පවරා ගැනිමට කටයුතු කළ යුතු විම. |

**5.** **කළමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ අමාත්‍යාංශය සඳහා පෞද්ගලික මුල්‍ය සමාගමකින් 2017 සහ 2018 වර්ෂ වලදී අවුරුදු 5 ක කාලයක් සඳහා වාහන දෙකක් ලබාගෙන තිබුණි. මෙම වාහන දෙක සඳහා 2021 දෙසැම්බර් 31 දින වන විට රු. 13,542,304 ක මුදලක් ගෙවා තිබූ අතර මාසිකව අවම වශයෙන් ධාවනය කල යුතු කි.මී. 3,000 දුර ප්‍රමාණයවත් ධාවනය කර නොතිබුණි. පිරිවැය වාර්තා අනුව අමාත්‍යාංශයේ සංචිත වාහන ධාවනය ඉතා අවම මට්ටමක පැවතියදී සංචිත වාහන ඵලදායීව උපයෝජනය කර නොතිබියදී සහ අමාත්‍යාංශය සතු වාහන වෙනත් ආයතනවලට පවරා දී තිබියදී කල්බදු පදනම මත වාහන ලබාගෙන 2021 දෙසැම්බර් 31 දින වන විට කල්බදු වාරික වශයෙන් රු. 13,542,304 ක් ගෙවා තිබුණි. | පැවති කොවිඩ් වසංගත තත්වය නිසා ඇදිරිනීතිය පැනවීම, සංචරණ සීමා ආදී හේතූන් නිසා ක්ෂේත්‍ර රාජකාරී සීමා සහිත වීම හේතුවෙන් අමාත්‍යාංශය සතු වාහන ධාවනය සීමා සහිත විය. | චක්‍රලේඛ මඟින් දී ඇති උපදෙස් ප්‍රකාරව වාහන ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු සිදු කල යුතු වීම. |

**6.** **මානව සම්පත් කළමනාකරණය**

2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත හා තත්‍ය සේවක සංඛ්‍යාව සම්බන්ධ තොරතුරු පහත දැක් වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු /අතිරික්ත |
|---|---|---|---|
| ජ්‍යේෂ්ඨ මට්ටම | 25 | 26 | +01 |
| තෘතිය මට්ටම | 01 | 04 | +03 |
| ද්විතිය මට්ටම | 16 | 283 | +267 |
| ප්‍රාථමික මට්ටම | 18 | 55 | +37 |
| | 60 | 368 | 308 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | | ගණන්දීමේ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තෘතිය මට්ටමට අනුව අනුමත තනතුරු සංඛ්‍යාව වුවද කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගනු ලැබු පරිපාලන නිලධාරි තනතුරද ඇතුළත්ව තනතුරු 3ක් අතිරික්තව පැවතුණි. | කාර්ය මණ්ඩලය අනුමත කර දෙන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත නැවත නැවත යොමු කර ඇතත් මෙතෙක් අනුමැතිය ලැබී නොමැත. | කටයුතු කඩිනම් කර පරිපාලන ගැටළු විසඳා ගතයුතු වීම. |
| (ආ) | ද්විතීය මට්ටමේ හා ප්‍රාථමික මට්ටමේ තනතුරු පිළිවෙලින් 16 හා 18 ක් අනුමත වුවද තත්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 283 ක් හා 55 ක් වශයෙන් අනුමත ප්‍රමාණය ඉක්මවා 304 ක් සේවයේ යොදවා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | 2020 සැප්තැම්බර් 04 දිනැති අංක DMS/SM/02 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපියේ 05 ජේදය අනුව මෙම අමාත්‍යාංශය ජනතා කේන්ද්‍රීය රජයේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනිම සඳහා අමාත්‍යාංශයේ විෂය පථය යටතේ සඳහන් කාර්යයන්, කර්තව්‍යයන්, ප්‍රමුඛතාවයන් සහ ඊට අදාල ඉලක්ක ලඟා කර ගැනිමේදී අදාල ක්ෂේත්‍රයන්හි විශේෂ දැනුම් හා නිපුණතාවන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩල දායකත්වයක් අවශ්‍ය වන බවත්, එම කරුණු සැලකිල්ලට ගෙන කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීම් කල යුතු බවත් ඒ සඳහා විධිමත් පරිදි යෝජනා ඉදිරිපත් කරන ලෙසත් දක්වා තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | -එම- | අදාල ක්ෂේත්‍රයන්හි විශේෂ දැනුම් හා නිපුණතාවන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩල යොදවා ගැනිමට කටයුතු කළයුතු විම. |

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා දැනට සිටින තත්‍ය කාර්යමණ්ඩලය අනුමත කර ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් 2021 ජනවාරි 19, 2021 පෙබරවාරි 11 සහ 2021 අගෝස්තු 02 දිනැති අංක SMS/ADM/1/2/1-2019 දරන ලිපි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණද 2022 වර්ෂය වන තෙක්ම ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡාවක් පැවැත්විණි. කාර්ය මණ්ඩල අනුමත කර එවීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සිදුකළ යුතුව ඇත . | කටයුතු කඩිනම් කර පරිපාලන ගැටළු විසඳා ගතයුතු වීම**.** |
| **(ඉ)** | **2010** මැයි **14** දිනැති අංක CA/1/17/1 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛය අනුව අමාත්‍යවරයාගේ සහය කාර්යමණ්ඩල සංයුතිය හා ප්‍රමාණය දක්වා තිබූ අතර එම සංයුතියෙහි ඇතුළත් නොවන වීඩියෝ කැමරා ශිල්පි**,** වෘත්තීය සමිති සම්බන්ධීකරණ ලේකම් සහ කැමරා ක්‍රියාකරු සහයක යන තනතුරු සඳහා නිලධාරින් බඳවා ගෙන ඔවුන් අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයට අනුයුක්ත කර වැටුප් ලබා දී තිබුණි**.** | වෘත්තිය සමිති සම්බන්ධීකරණ ලේකම් අමාත්‍ය මණ්ඩල සංදේශයකින් පත් කර ඇත. විඩියෝ කැමරා ශිල්පී සහ කැමරා සහායක යන තනතුරු අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයෙහි තවකාලික තනතුරු ලෙස දක්වා ඇත. | චක්‍රලේඛය අනුව අමාත්‍යවරයාගේ සහය කාර්යමණ්ඩල සංයුතියෙහි ඇතුළත් සංඛ්‍යාව නොඉක්මවීමට වගබලා ගතයුතු වීම**.** |